හෙළ බිම සංවිධානයෙන් බෝයගනේ හමුදා කඳවුරට නව ගොඩනැගිල්ලක්

ලක්බිම පුවත එළදරයි

*රෝහිත ශ්‍රී හේමන්ත,දඹදෙණිය,මහේන්ද්‍ර ආරියවංශ, පොල්ගහවෙල*

ඉන්දියන් සාගරයේ මුතු ඇටය යන විරුදාවලියෙන් හඳුන්වන මේ පුංචි ලක් මෑණියන්ට ආදරය කරන මිනිසුන් මේ මිහිපිට නැතිවාම නොවේ. ඇතැම් විට ඔවුන් ලංකාවේ දිවි ගෙවයි. තවත් විටෙක සැතපුම් දහස් ගණන් දුර වෙනත් රටක දිවි ගෙවයි. නමුත් සැබවින්ම ඔවුන් අපේ මේ පුංචි ලංකාවට ආදරෙයි. ඔවුන් සැම විටම ලංකාවට පිහිටවීමට උත්සුක වෙයි. එවන් සුවිශේෂී වූ අවස්ථාවක් පසුගියදා උදා විය.

2005 නොවැම්බර් මස 23 වෙනි බදාදා අප පුවත්පතේ "ඔවුහු යුද බිමට නොගියද දේශය වෙනුවෙන් කැපවී සිටිති" ශීර්ෂ පාඨය යටතේ පළ වූ ලිපිය දැක ඒ කෙරෙහි අවධානය යොමු කළ මැද පෙරදිග ශ්‍රී ලාංකිකයන්ගේ එකතුවෙන් සැදුම්ලත් "හෙළබිම" සංවිධානයෙන් කුරුණෑගල බෝයගනේ හමුදා කඳවුරට විශාල අඩුවක්ව පැවති අංග සම්පූර්ණ ආබාධිත භට නිවස්නයක් සඳහා මුල්ගල තබන ලදී. මේ සඳහා වැය වන මුදල රුපියල් ලක්ෂ 14කි.

ආබාධිත සෙබළුන් 400ට ආසන්න ප්‍රමාණයක් මෙහි සේවය කරන අතර ඔවුන් විවිධ හැකියාවන්ගෙන් යුක්ත වූවෝ වෙති. එහෙත් පහසුකම් අඩුකමින් ඔවුන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කිරමට අවස්ථාව නොමැත. ඒ නිසාම මෙම ගොඩනැගිල්ල ඉදිකිරමට හෙළබිම සංවිධානය කටයුතු යොදා ඇත. මුල්ගල තැබීමේ උත්සවයට හෙළබිම සංවිධානයේ අනුශාසක බෙංගමුවේ නාලක හිමි ඇතුළු නියෝජිත පිරිසක් සහභාගි වූහ. සෙත් පිරිත් සජ්ජායනා මධ්‍යයේ නව ගොඩනැගිල්ලට මුල්ගල තැබීම සිදු කළේ සා.සෙ. 512833 එම්.ඕ.එම්. ජයසිංහයි.

මෙහිදී අදහස් දැක්වූ හෙළබිම සංවිධානයේ අනුශාසක බෙංගමුවේ නාලක හිමියෝ.

නිවහනක් නොමැතිව නිවහනක් හදාගන්න තමාගේ දූවට පුතාට උගන්වන්න ක්‍රමයක් නොමැතිවයි අපේ පිරිස විදේශ ගත වෙන්නේ. නමුත් ඔවුන් විදේශ රටවල සිටියත් ලංකාවේ ජීවත්වන ජනතාවට ආදරෙයි. එම නිසාම ඔවුන් ලාංකික ජනතාවට පිහිටවන්නට අරමුදලක් පිහිටවලා තියෙන්නේ. මේ සඳහා මොවුන් මුදල් සොයන ක්‍රම කිහිපයක් තිබෙනවා. එයින් එක් ක්‍රමයකි ලේ විකිණීම. තමන්ගේ "ලේ" අලෙවි කර ඔවුන් මුදල් සොයා ගන්නේ.

රට වෙනුවෙන් විශාල සේවයක් කළ බොහෝ පිරිස් අද අත, පය අහිමිව සිටිනවා. ඔවුන්ගේ අත පය අහිමි වුණේ සොරකම් කරන්නට ගොස් නොවේ. මේ මාතෘ භූමිය ආරක්ෂා කිරමට ගොසිනුයි. එනිසා රණවිරුවා වාසනාවන්තයි. ඔවුන් රටට ආඩම්බරයකි.

හෙළබිම සංවිධානයේ නියෝජිත සුනිල් චන්ද්‍ර කුමාර මහතා අදහස් දක්වමින් අප සමග මෙසේ පැවසීය.

අපි මුලින්ම බෝයගනේ යුද හමුදා කඳවුරේ අඩුපාඩු සහිත පුවත දැක්කේ "ලක්බිම" පුවත්පතේ. ඒ අනුව "ලක්බිම" පුවත්පත් ආයතනයෙන් අදාළ තොරතුරු අරන් බෝයගනේ යුද හමුදා කඳවුරේ නිරක්ෂණ චාරිකාවක නියලුණා. ඉන්පසුව අපි මේ ගොඩනැගිල්ල සැකසීමට කටයුතු කළා. 1998 වසරේදියි මේ

සංවිධානය පිහිටුවා ගත්තේ. විශේෂයෙන්ම මේ වන විටත් හමුදා කඳවුරුවලට යටිතල පහසුකම් සපයා තිබෙනවා. උතුරු නැගෙනහිර ගම්වැසියන්ට පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා තිබෙනවා.

අණදෙන නිලධාරි සිසිර පිලපිටිය මහතා අප සමග අදහස් දක්වමින් මෙසේ පැවසීය.

මෙය ඉතිහාසගත වන අවස්ථාවක් ලංකාවෙන් සැතපුම් දහස් ගණනක් දුර සිටියත් ලංකාවට ආදරය කරන හමුදා සෙබළුන්ට ආදරය කරන මිනිසුන් සිටීම ගැන අපි ආඩම්බර විය යුතුයි. ඒ අනුව අවශ්‍ය මග පෙන්වා දුන් "ලක්බිම" පුවත්පතටත්, හෙළබිම සංවිධානයටත් ස්තුතිය පුද කරනවා.

බෝයගනේ විජයබා යුද හමුදා කඳවුරේ සේනාවිධායක ඒ. කාරියකරවන මහතා.

සිංහලකම ගැන කැක්කුමක් තිබෙන මිනිසුන් අප අතර සිටිනවා. රටක් වෙනුවෙන් සේවය කළ හැකි ක්‍රම දෙකක් තිබෙනවා. ඒ ඉඳුරාම සේවය කිරම හා වක්‍රව සේවය කිරම. යුද හමුදාව ඉඳුරාම සේවය කරන අතර මෙවන් උපකාර වක්‍රව කරන සේවාවන්ය. යුද්ධයට යා යුතු නැහැ. නමුත් ඒ වෙනුවෙන් අවශ්‍ය යටිතල පහසුකම් සපයන උදව් උපකාර කිරම හමුදා සෙබළා දිරි ගැන්වීමක්.

යුද්ධයේදී පාබල සෙබළා කියන්නේ හොඳ ආයුධයකි. ඔවුන් සංසන්දනය කරන්නේ මෝටර රථයක එන්ජිමටයි. යුද්ධයේදී ඉදිරියෙන් සිටින්නේ අපේ මේ සෙබළා. කෙසේවුවද යුද හමුදා සෙබළාට මුහුණ දෙන්න සිදුවන අඩුපාඩු ලොවට හෙළිකළ "ලක්බිම" පුවත්පතටත් ඒ අනුව අපට උදව් කළ මැද පෙරදිග හෙළබිම සංවිධානයටත් ස්තුතිය පුද කර සිටිනවා.

මෙම කටයුතු සම්බන්ධීකරණය කිරමේදී සහය දුන් කැප්ටන් අබේසිංහ මහතා සහ සෙසු නිලයන්ගේ